8 – ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය

# පරිසර හිතකාමී කඩදාසි

15

❖ නිපුණතාව - භාෂාව නිරවුල් ව හා නිවැරැදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි .

▪ නිපුණතා මට්ටම - පාඨකයා ආකර්ෂණය වන පරිදි නිර්මාණාත්මක ව අදහස් ඉදිරිපත් කරමින් ලියයි .





# ක්‍රියාකාරකම - 1

➢ පහත A තීරුවේ ඇති වාක්‍යාංශ සඳහා ගැළපෙන වාක්‍යාංශ B තීරුවෙන් තෝරා හිස්තැන් පුරවන්න .

A

1. ‘පරිසර හිතකාමී ’ පාඩම කියවීමෙන් -------------------------------------------------------
2. ‘පරිසර හිතකාමී ’ පාඩමට තේමා වී ඇත්තේ ------------------------------------------------
3. ‘පරිසර හිතකාමී ’ පාඩමට අදාළ ලිපිය උපුටා ගත් සඟරාව -----------------------------
4. ‘පරිසර හිතකාමී ’ පාඩමට අදාළ ලිපියේ නිර්මාතෘවරිය වන්නේ ---------------------------
5. ‘පරිසර හිතකාමී ’ පාඩමට අදාළ ලිපිය සඟරාවේ පළ වූයේ ---------------------

B

- ‘අලි වසුරුවලින් කඩදාසි , මුදල් සහ රැකියා ’ යනුවෙනි .
- EDEX නම් වේ .
- සඟරා ලිපියක් කියවා එය අවබෝධ කර ගැනීමට අවස්ථාව සැලසේ .
- අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙන කර්මාන්තයකි .
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සාවිත්‍රි රණසිංහ මහත්මිය යි .



# ක්‍රියාකාරකම - 2

➢ **පහත දැක්වෙන ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු රූපසටහනින් තෝරා ලියන්න .**

1.කඩදාසි කර්මාන්තය පරිසරයට හානිකර කර්මාන්තයක් ලෙස හැඳින්වීමට හේතු වන කරුණක් නම් කරන්න .

2. කඩදාසි නිෂ්පාදනයේ දී පරිසරයට නිකුත් වන විෂ රසායනික කොටස් හඳුන්වන නම කුමක් ද ?

3.පරිසරයට හානි නොවන ආකාරයෙන් කඩදාසි නිෂ්පාදනයට යොදා ගන්නා ප්‍රධාන අමුද්‍රව්‍යය කුමක් ද ?

4.පරිසරයට හානි නොවන ආකාරයෙන් කඩදාසි නිෂ්පාදනයේ ප්‍රධාන අමුද්‍රව්‍යය හැරුණු විට යොදා ගන්නා වෙනත් අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න .

5 .හස්ත කඩදාසි කර්මාන්තය ව්‍යාප්ත වී ඇති ප්‍රදේශයක් නම් කරන්න .

- **සීගිරියේ රංගිරිගම**
- **අලි වසුරු හෙවත් අලි ඉලත්ති**
- **මහා පරිමාණ වශයෙන්සිදුවන වනාන්තර විනාශය**
- **කෙසෙල් පට්ටා , පිදුරු**
- **බ්ලැක් ලිකර්**

# ක්‍රියාකාරකම - 3

➢ අලි වසුරුවලින් කඩදාසි නිෂ්පාදනයේ පියවර නිවැරදි ව අංකනය කරන්න .

- තම්බා ගත් අලි වසුරු ඇඹරුම් යන්ත්‍රයක ආධාරයෙන් අඹරා ගැනීම .
- අලි වසුරු සූර්යාලෝකයෙන් වියළා ගැනීම .
- ඉස්කුරුප්පු පීඩකයකින් පල්පවල රැඳී ජලය ඉවත් කිරීම .
- අලි වසුරු දිනක් පුරා උණුසුම් ජලයෙන් තැම්බීම .
- අඹරාගෙන සාදා ගත් පල්ප අච්චුවකට දමා ජලය සහිත තටාකයක ගිල්වීම .

# ක්‍රියාකාරකම - 4

➢ හස්ත කඩදාසි ආශ්‍රිත වෙළෙඳපොළට හඳුන්වා දී ඇති නිමි භාණ්ඩ කිහිපයක් පහත දැක්වේ . ඒවා සොයා යා කරන්න .

| | | |
|---|---|---|
| පොත් | නිමි භාණ්ඩ | මලු |
| ප්ලාස්ටික් | | ඇඳුම් |
| රබර් | | පෙට්ටි |
| කඩදාසි | | මෝටර් රථ |
| පින්තූර ඇල්බම් | | සුබ පැතුම් පත් කවර |

# ක්‍රියාකාරකම - 5

***හස්ත කඩදාසි සදහා ඉල්ලුමක් ඇති රටවල් තෝරා  හරි  ලකුණ යොදන්න .***

| | | |
|---|---|---|
| ඇමරිකා එක්සත් | මාලදිවයින | භූතානය |
| ජපානය | දකුණු  අප්‍රිකාව | රුසියාව |
| නේපාලය | පෝලන්තය | ඔස්ට්‍රියාව |
| එක්සත් රාජධානිය | රුසියාව | ඉතාලිය |
| භූතානය | සිංගප්පූරුව | නෙදර්ලන්තය |
| ප්‍රංසය | ඕස්ට්‍රේලියාව | ඇෆ්ගනිස්ථානය |

# ක්‍රියාකාරකම - 6

➢ ***පහත එක් එක් කරුණු අදාළ වන්නේ සඟරාවටද බිත්ති පුවත්පතට ද යන්න සොයා වගු ගත කරන්න***

1. විශේෂ පුවරුවක හෝ කඩදාසියක විවෘත ලෙස ප්‍රදර්ශනයට තබා ඇති ප්‍රකාශනයකි.
2. නිර්මාණාත්මක ලේඛනයකි .
3. මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස දිගු කලක් පවති.
4. එක් කලාපයක පළ වූ ලිපි නැවත වෙනස් කළ නොහැකිය .
5. සීමිත කාල පරාසයකදී පමණක් ප්‍රදර්ශනය වන නිසා කෙටි කාලීනය .
6. පළ කරන ලිපි නැවත නැවත වෙනස් කළ හැකිය .
7. පළ කරන ලිපි කියවීමට කාලය බාධාවක් නොවේ.
8. ඉඩ කඩ සීමාසහිත නිසා ලිපි සංක්ෂිප්ත විය යුතුය.
9. ඉඩකඩ සීමා නොවන නිසා ලිපි සංක්ෂිප්ත වීම අනිවාර්ය නොවේ .
10. ලිපි කියවීමට ඇත්තේ සීමිත කාලයකි .

# ක්‍රියාකාරකම - 7
# පසු වැඩ

- ✓ පහත දැක්වෙන මාතෘකා ඔස්සේ බිත්ති පුවත් පතකට ලිපි ලියන්න .

- ❖ ලොව ම ගිල ගත් කොරෝනා.
- ❖ ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන
- ❖ පරිසරය රැක ගමු

- ✓ ඔබ දන්නා සඟරාවල නම් ලැයිස්තුවක් සකස් කරන්න .

- ✓ ‘කොරෝනා රෝගයෙන් බේරීමට අප ගත යුතු ක්‍රියාමාර්ග මොනවා ද ?’ යන තේමාව යටතේ සඟරාවකට ලිපියක් ලියන්න .

# ක්‍රියාකාරකම - 1
# පිළිතුරු



1. ‘පරිසර හිතකාමී ’ පාඩම කියවීමෙන් සඟරා ලිපියක් කියවා එය අවබෝධ කර ගැනීමට අවස්ථාව සැලසේ .

2. ‘පරිසර හිතකාමී ’ පාඩමට තේමා වී ඇත්තේ  අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙන කර්මාන්තයකි .

3. ‘පරිසර හිතකාමී ’ පාඩමට අදාළ ලිපිය උපුටා ගත්  සඟරාව   EDEX නම්  වේ .

4. ‘පරිසර හිතකාමී ’ පාඩමට අදාළ ලිපියේ  නිර්මාතෘවරිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සාවිත්‍රි රණසිංහ  මහත්මිය යි .

5. ‘පරිසර හිතකාමී ’ පාඩමට අදාළ ලිපිය සඟරාවේ පළ වූයේ ‘අලි වසුරුවලින් කඩදාසි , මුදල් සහ රැකියා ’ යනුවෙනි .

# ක්‍රියාකාරකම - 2
# පිළිතුරු

.

1. මහා පරිමාණ වශයෙන්සිදුවන වනාන්තර විනාශය

2. බ්ලක් ලිකර්

3. අලි වසුරු හෙවත් අලි ඉලත්ති

4.කෙසෙල් පට්ටා

5 .සීගිරියේ රංගිරිගම





# ක්‍රියාකාරකම - 3
# පිළිතුරු

- තම්බා ගත් අලි වසුරු ඇඹරුම් යන්ත්‍රයක ආධාරයෙන් අඹරා ගැනීම . 3
- අලි වසුරු සූර්යාලෝකයෙන් වියළා ගැනීම . 1
- ඉස්කුරුප්පු පීඩකයකින් පල්පවල රැඳී ජලය ඉවත් කිරීම . 5
- අලි වසුරු දිනක් පුරා උණුසුම් ජලයෙන් තැම්බීම . 2
- අඹරාගෙන සාදා ගත් පල්ප අච්චුවකට දමා ජලය සහිත තටාකයක ගිල්වීම . 4

# ක්‍රියාකාරකම - 4
# පිළිතුරු



නිමි හාණ්ඩ

- පොත්
- ප්ලාස්ටික්
- රබර්
- කඩදාසි
- පින්තූර ඇල්බම
- මලු
- ඇඳුම්
- පෙට්ටි
- මෝටර් රථ
- සුබ පැතුම් පත් කවර



# ක්‍රියාකාරකම - 5
# පිළිතුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | √ | මාලදිවයින | √ | භූතානය | |
| ජපානය | √ | දකුණු අප්‍රිකාව | | රුසියාව | |
| නේපාලය | | පෝලන්තය | | ඔස්ට්‍රියාව | √ |
| එක්සත් රාජධානිය | √ | රුසියාව | √ | ඉතාලිය | √ |
| භූතානය | | සිංගප්පූරුව | √ | නෙදර්ලන්තය | √ |
| ප්‍රංසය | √ | ඕස්ට්‍රේලියාව | √ | ඇෆ්ගනිස්ථානය | |



# ක්‍රියාකාරකම - 6
# පිළිතුරු

| *බිත්ති පුවත් පත* | *සඟරා* |
|---|---|
| විශේෂ පුවරුවක හෝ කඩදාසියක විවෘත ලෙස ප්‍රදර්ශනයට තබා ඇති ප්‍රකාශනයකි. | නිර්මාණාත්මක ලේඛනයකි |
| නිර්මාණාත්මක ලේඛනයකි | එක් කලාපයක පළ වූ ලිපි නැවත වෙනස් කළ නොහැකිය . |
| සීමිත කාල පරාසයකදී පමණක් ප්‍රදර්ශනය වන නිසා කෙටි කාලීනය . | පළ කරන ලිපි කියවීමට කාලය බාධාවක් නොවේ. |
| පළ කරන ලිපි නැවත නැවත වෙනස් කළ හැකිය . | ඉඩකඩ සීමා නොවන නිසා ලිපි සංක්ෂිප්ත වීම අනිවාර්ය නොවේ . |
| ඉඩ කඩ සීමාසහිත නිසා ලිපි සංක්ෂිප්ත විය යුතුය. | |
| ලිපි කියවීමට ඇත්තේ සීමිත කාලයකි . | |